# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක : **10/2014(i)**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2015, ජූනි මස 17 වැනිදා

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>ආචාර්යවරුන් සහ නිලධාරීන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු</u>

ආචාර්යවරුන් සහ නිලධාරීන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් 1989.10.26 දිනැතිව නිකුත් කරන ලද අංක 408 දරන කොමිෂන් සභා චක්‍රලේඛය සහ ඉන් අනතුරුව ඒ සම්බන්ධයෙන් නිකුත් කර ඇති කොමිෂන් සභා චක්‍රලේඛයන් සහ ආයතන චක්‍රලේඛ ලිපි කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

චක්‍රලේඛ අංක 408 හා අනතුරුව සිදු කරන ලද සංශෝධනයන්හි ප්‍රතිපාදනයන් යටතට විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර දරන්නන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු හිමිකම් ලබා දීමට 2015.05.21 දින රැස් වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 917 වන සභා වාරයේදි තීරණය කරන ලදී.

2015.06.01 දින සිට මෙම චක්‍රලේඛ ප්‍රතිපාදන ක්‍රියාත්මක වන අතර කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූජීසී/එච්ආර්/6/4/3